# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2240/7 - 2021 අගෝස්තු මස 09 වැනි සඳුදා - 2021.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: MLB/LND/LNDAQ/L1/57.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2017/WS/34.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටුවන්ගොඩ ගමේ මු. පි. මාර/2856 පිඹුරේ, කැබලි අංක 1 වශයෙන් දැක්වෙන පහත සඳහන් ඉඩම මාතර iv වන අදියර ජල සම්පාදන ක්‍රමය යටතේ තුළුම්ං ළිඳ හා පොම්පාගාරය ඉඩමට පිවිසෙන මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගෙන තිබේ.

**උපලේඛනය**

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: හෝම්පල හේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ඉඩමේ මුල් හිමිකම කියන්නා: කේ. එම්. ගුනදාස මයා; ප්‍රමාණය: හෙක්. 0.0013

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2021 අගෝස්තු මස 17 වැනි දින පෙ. ව. 10.30ට මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය. තව ද අගෝස්තු මස 10 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**කේ. ජී. ආර්. ජයනාත්,**
ප්‍රාදේශීය ලේකම්,
මාලිම්බඩ.

2021 ජූලි මස 30 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-358

1A - G 34817 – 15 (2021/8) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*